# වාර්ෂික වාර්තාව

# 2018

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

# දැක්ම

ළමුන් සඳහා ළමා හිතකාමී සහ
සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම

# මෙහෙවර

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව
තහවුරු කිරීම

# 2018 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| නීතිඥ මරිනි ද ලිවේරා මහත්මිය<br>(2017.04.11 සිට 2018 අප්‍රේල් මස දක්වා)<br>නීතිඥ එච්. එම් අබයරත්න මහතා<br>(2018.04.09 සිට) | සභාපතිනිය,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල,<br>ශ්‍රී ජයවර්ධනපුර. |
| නීතිඥ එච්. එම්. අබයරත්න මහතා<br>(2017.12.04 සිට 2018.04.08)<br><br>නීතිඥ සුජාතා කුලතුංග මහත්මිය<br>(2018.06.18 සිට) | නියෝජ්‍ය සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල.<br>ශ්‍රී ජයවර්ධනපුර.<br><br>නියෝජ්‍ය සභාපතිනිය,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල,<br>ශ්‍රී ජයවර්ධනපුර. |
| මහාචාර්ය අශ්විනි ඩී. ප්‍රනාන්දු මහත්මිය | ජ්‍යෙෂ්ඨ ළමා රෝග විශේෂඥ,<br>මූලික රෝහල,<br>රාගම. |
| වෛද්‍ය අපේක්ෂා හේවාගීගන මහත්මිය | මනෝ වෛද්‍ය විශේෂඥ<br>රිජ්වේ ආර්යා ළමා රෝහල,<br>බොරැල්ල. |
| වෛද්‍ය යූ. ඒ. කේ තෙන්නකෝන් මහතා | ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරි,<br>විෂවේදය හා නීති වෛද්‍ය ආයතනය,<br>බොරැල්ල, කොළඹ 08. |
| නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය | ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිස්ටර් ජනරාල්<br>නීතිපති දෙපාර්තමේන්තුව,<br>කොළඹ 12. |
| වෛද්‍ය අයේෂා ලොකුබාලසූරිය මහත්මිය | ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය විශේෂඥ,<br>පවුල් සෞඛ්‍ය කාර්යාංශය,<br>කොළඹ 08. |
| එම්. ආර්. ලතීෆ් මහතා | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,<br>විශේෂ කාර්යබලකා මූලස්ථානය,<br>බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07. |
| චන්ද්‍රිමා සිගේරා මහත්මිය | කොමසාරිස්,<br>පරිවාස හා ළමාරක්ෂක සේවා<br>දෙපාර්තමේන්තුව,<br>II වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල |
| ඒ. විමලවීර මහතා | කම්කරු කොමසාරිස් ජනරාල්,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>නාරාහේන්පිට, කොළඹ 05. |

| | |
|---|---|
| සුජීවා පල්ලියගුරු මහත්මිය | අධ්‍යක්ෂ සංවර්ධන,<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය,<br>II වන අදියර, සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල. |
| ආර්.එම්.ඒ රත්නායක මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව,<br>මුදල් අමාත්‍යාංශය,<br>කොළඹ 01. |
| අසංක සංජය බණ්ඩාර මහතා | ජ්‍යෙෂ්ඨ පුහුණු උපදේශක,<br>පළාත් පුහුණු මණ්ඩලය,<br>ප්‍රධාන ලේකම් කාර්යාලය, වයඹ පළාත. |
| ඒ. ආර්. පී. සී. උදයකුමාර මහතා | අපරාධ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ශ්‍රී ජයවර්ධනපුර, විශ්වවිද්‍යාලය |

## 2018 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය

| | |
|---|---|
| රෝෂිණී විලාසිතා මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>අධිකරණ අමාත්‍යාංශය,<br>ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය,<br>කොළඹ 12. |
| ආචාර්ය මධුරා එම්. වේහැල්ල මහත්මිය | අතිරේක ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල. |
| ඩබ්ලිව්. ඒ. කුලසූරිය මහතා | අතිරේක ලේකම්,<br>රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය,<br>බාලදක්ෂ මාවත,<br>කොළඹ 03. |
| පී. ජේ. ඩී. ප්‍රනාන්දු මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශය,<br>සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල. |
| ඒ. එච්. එල්. ඩී. සොයිසා මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය.<br>අංක 330, යුනියන් පෙදෙස,<br>කොළඹ 02. |
| පී. මහදේව මහතා | කොමසාරිස්,<br>කාන්තා හා ළමා කටයුතු අංශය,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>කොළඹ 05. |
| හේමා පෙරේරා මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය,<br>අංක 163, කිරුළපන මාවත,<br>පොල්හේන්ගොඩ,<br>කොළඹ 05. |

| පටුන | පිටු අංකය |
|---|---|
| ▪ හැඳින්වීම | 01 |
| ▪ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය | 02 |
| ▪ අධිකාරියේ ව්‍යුහය | 03 |
| ▪ 2018 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය | 04 |
| ▪ 2018 ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය | 05-06 |
| සංවර්ධන වැඩටහන් | |
| ▪ ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය | 07 |
| ▪ පාසල් විෂය මාලාව සඳහා ජීවන නිපුණතා හඳුන්වා දීම | 07-08 |
| ▪ හදිසි ආපදා තත්ත්වයන් හිදී ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පිළිපැදිය යුතු වන මාර්ගෝපදේශ ඇතුළත් අත්පොත සකස් කිරීම (දරුවන් සඳහා මනෝ සමාජීය ප්‍රථමාධාර) | 08 |
| ▪ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම | 08 |
| ▪ සාමාන්‍ය ළමා සුරැකුම් පාඨමාලාවේ පුහුණුකරුවන්ගේ මාර්ගෝපදේශය මුද්‍රණය කිරීම (NVQ Level 4) | 08 |
| ▪ සහතික කළ පාසල් සහ රැඳවුම් නිවාසවල සිටින ළමුන් සඳහා මනෝ සමාජීය මැදිහත්කරණය | 09 |
| ▪ දෙමව්පියන් සහ ගුරුවරුන් සඳහා වන ධනාත්මක ශික්ෂණය පිළිබඳ අත්පොත සකස් කිරීම | 09 |
| ▪ ළමා හිතකාමී පාසල් පරිසර නිර්මාණය කිරීම | 09 |
| ▪ ජන පවුර ජාතික වැඩසටහන (ප්‍රජාමූල සංවිධාන බලගැන්වීමේ වැඩසටහන) | 09 |
| ▪ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම | 10 |
| ▪ සෞඛ්‍ය වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධනය | 10 |
| ▪ ළමා අපයෝජන වලින් ළමයින් ආරක්ෂාකර ගැනීමේ කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන | 10 |
| ▪ ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව "ළමා ශ්‍රමය පිටු දකිමු" තේමාව යටතේ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයෙහි නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 10 |
| ▪ ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනයට සමගාමීව වතු ආශ්‍රිතව හා ධීවර ප්‍රජාව ආශ්‍රිතව ජීවත්වන ගැහැණු ළමුන් සවිබල ගැන්වීමේ වැඩසටහන | 10-11 |
| ▪ වෙරළබඩ කලාපය තුළ ළමා ආරක්ෂාව සඳහා වන නියමු වැඩසටහන | 11 |
| ▪ වතු ආශ්‍රිතව ජීවත් වන ළමුන්ගේ රැකවරණය තහවුරු කිරීමේ වැඩසටහන | 11 |
| ▪ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම. | 11 |
| ▪ ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රදර්ශන හා ජංගම සේවා පැවැත්වීම හා ළමා ආරක්ෂාව පිළිබඳ නාට්‍ය ඉදිරිපත් කිරීම. | 13 |
| ▪ සුනාමි ව්‍යසනය හේතු කොට ගෙන වින්දිත වූ ළමුන් සඳහා සුබසාධන කටයුතු සිදුකිරීම. | |
| ▪ ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම | 14 |
| ▪ ළමා රැකවරණ සේවා සපයන ළමා නිවාස හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) අධීක්ෂණය කිරීමේ වැඩසටහන | 14 |
| ▪ මානසික සෞඛ්‍ය ගොඩ නැගීම සඳහා සහය ලබාදීම | 14 |
| ▪ ළමා අපයෝජනය හේතු කොට වින්දිත, ආන්තික හා අනාරක්ෂිත වූ ළමුන් සඳහා ලෝක ළමා දින සැමරුමට සමගාමීව අධ්‍යාපනික පහසුකම් සැපයීම | 14 |
| ▪ හදිසි ආපදා තත්ත්වයන් සඳහා සූදානම් වීම හා දැනුවත් කිරීම | 15 |
| ▪ සංවර්ධන වැඩසටහන් නියාමනය හා ඇගයීම | 15 |
| ▪ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ නව තොරතුරු වෙබ් අඩවිය සංවර්ධනය කිරීම. | 15<br>15 |
| ▪ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුස්තකාලය සංවර්ධනය කිරීම. | 16 |
| ▪ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන ජාතික මාර්ගෝපදේශය සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම | 17 |

| | |
|---|---|
| ▪ අඩු වයස් විවාහ වැළැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 17 |
| ▪ ළමා ජාවාරම්කරණයේ පවතින ගැටලු නිර්මාණශීලිව අවබෝධකර ගැනීම සහ එම වින්දිතයින් නැවත සමාජගත කිරීම පිළිබඳ අත්පොත නිර්මාණය කිරීම | 17 |
| ▪ තොරතුරු ලබාදීම. | 18 |
| ▪ ජන මාධ්‍ය සම්බන්ධීකරණය | 18 |
| ▪ ළමා අපයෝජන / ළමා සැකකරුවන් පිළිබඳ වාර්තාකරණයේදී ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ජනමාධ්‍යවේදීන් විසින් සැළකිලිමත්විය යුතු කරුණු පිළිබඳ ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය | 18 |
| ▪ 2018 ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දින ජාතික උත්සවය | 18-19 |
| ▪ ළමා ආරක්ෂාව පිළිබඳව තොරතුරු ඇතුළත් කර නිර්මාණය කරන ලද, දිවයිනේ පළමු බස් නැවතුම්පල ජනතා අයිතියට පත්කිරීම. | 20 |
| ▪ 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව | 20 |
| ▪ ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි | 21 |
| ▪ නීතිමය කර්තව්‍යයන් | 23 |
| ▪ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත යොමුවන පැමිණිලි සඳහා නීති අංශයේ දායකත්වය | 24 |
| ▪ විශේෂ පොලිස් විමර්ශන | |
| ▪ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරින් සඳහා 2018 වර්ෂය තුළ පැවැත්වූ පුහුණු වැඩමුළු. | 25 |
| ▪ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය | 28 |
| ▪ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2018.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 29 |
| ▪ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 30-31 |
| ▪ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය | 32 |
| ▪ විගණන වාර්තා | 33-38 |

## හැඳින්වීම

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නැවත පරීක්ෂා කළ යුතු බව අවධාරණය කළ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වසරේ කාර්යයන් කිහිපයක් ආරම්භ කිරීමට කටයුතු කර ඇත. ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම මෙන්ම ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් බැඳුණු මාර්ගෝපදේශ සකස් කළ යුතු බව අවධාරණය විය. ඒ අනුව මෙම වසර තුළ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත.

1989 නොවැම්බර් 20 වන දින "එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය විශ්ව ප්‍රකාශනයක්" ලෙස සම්මත කර ගන්නා ලදී. මෙම ප්‍රඥප්තිය වගන්ති 54 කින් සමන්විත වන අතර, එමගින් ලොව සෑම ළමයෙකුටම හිමි විය යුතු අයිතිවාසිකම් මෙන් ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය සතු වගකීම ද විග්‍රහ කර තිබේ. ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් එකල පැවති සමාජ තත්ත්වය විමර්ශනය කිරීමේ දී, ළමා වෙළඳාම, ළමා ගණිකා වෘත්තිය, ළමුන් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම අරමුණු විය. එහිදී ජාත්‍යන්තර වශයෙන් පැවති රහස් වෙළඳාම ඉහළ යාම දැඩි ලෙස සැළකිලිමත් වෙමින් ද, ආයුධ සන්නද්ධ අරගලයන් හි දී ළමයින් බලහත්කාරයෙන් යුධ සේවාවෙහි යෙදවීම හෝ බඳවා ගැනීම අන්තර් ජාතික අපරාධයක් ලෙස දක්වමින් ද වර්ෂ 2000 දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ට, ළමුන් සන්නද්ධ අරගලවලට බඳවා ගැනීම වැළැක්වීම සහ ළමා වෙළඳාම, ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සඳහා යොදා ගැනීම වැළැක්වීම යන අතුරු කෙටුම්පත් ඇතුළත් කරන ලදී.

ලොව පැවති මෙම ප්‍රවණතාවයත් සමග ශ්‍රී ලංකා රජය ද එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා 1990 වසරේදී අත්සන් කොට තම එකඟතාවය පළ කරන ලදි. 1991 ජූලි 12 වන දින මෙම සම්මුතිය අනුමත විය. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් 1996 වසරේ දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවනු ලැබීය. එහි දී කරුණු විමර්ශනය කළ එම කමිටුව ළමා අපයෝජන අවම කිරීම සඳහා අධිකාරි බලතල සහිත රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 1998 අගෝස්තු මාසයේදී අධිකරණ ඇමති විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. 1998 නොවැම්බර් මාසයේදී මෙම පනත පාර්ලිමේන්තුවේදී ඒකමතිකව සම්මත විය. ඒ අනුව 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. 1990 ජූනි මාසයේදී අධිකාරියේ සභාපති හා පාලක සභාව පත් කිරීමෙන් පසුව අධිකාරිය ක්‍රියාත්මක විය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආරම්භයේ සිටම වර්තමානය දක්වාම ළමා අපයෝජන වළක්වා ගැනීම, ළමා අපයෝජනයන් හි දී ඊට අදාළ නිසි පියවර ගැනීම හා වින්දිත ළමුන් යළි සමාජගත කිරීමට අදාළ කටයුතු වෙනුවෙන් ක්‍රියා කරමින් සිටියි.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන අතර, 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිතභාවයට පත් ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත මගින්ද අධිකාරිය වෙත බලතල හිමි ව පවතියි. තවද 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මගින් ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ විට අධිකාරියට වාර්තා වීමේදී තෙවන පාර්ශවකරුවෙකු වශයෙන් ඊට මැදිහත් වීම සිදු කළ හැකිය.

ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ළමා අපයෝජන සිදුවීම් කඩිනම්ව සහ විධිමත්ව වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2010 ජූලි 22 වන දින "1929" ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදී. මෙම දුරකථන සේවය ආරම්භයත් සමග සමාජයේ සැඟව පැවති ළමා අපයෝජන සිද්ධි වාර්තා වීම ක්‍රම ක්‍රමයෙන් ඉහළ අගයක් ගැනීම දක්නට ලැබුණි. අද වන විට ලංකාවේ සියලු ම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ළමා අපයෝජන වාර්තා වන අතර, උපදේශන සේවාවන් ද මෙමගින් ලබාගත හැකිය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂාව වෙනුවෙන් මෙම වසර තුළදීත් ජාතික ක්‍රියාකාරී සැලසුම්වලට අදාළ කාර්යයන් සිදු කර ඇත.

## ප්‍රධාන කාර්යභාරය

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුල් කාර්ය භාරයක් පැවරී ඇත.


- ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජන වලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- එවැනි අපයෝජන වලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- අපයෝජන වලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.
- ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජන වලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථා වල දී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිසා හා ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.
- සියලු ආකාර ළමා අපයෝජනවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීම.
- ළමා අපයෝජන හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.
- සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැළකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමු වීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුභසිද්ධිය සඳහා පියවර ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුලු කර ගැනීම.
- අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම.
- ළමා අපයෝජන පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ පැමිණිලි නිසි බලධාරින් වෙත යොමු කිරීම.
- ළමා අපයෝජන වලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධාන වලට උපදෙස් දීම හා සහය වීම.
- ළමා අපයෝජන සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වා ගෙන යාම.
- අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුන්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.
- ළමා අපයෝජන සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- ළමයින්ගේ සුරක්ෂිත භාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබා දීම.
- ළමා අපයෝජන වලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමග සංවාදයෙහි යෙදීම.
- ළමා අපයෝජන පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.
- සියලු ආකාර ළමා අපයෝජන අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර් ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

## අධිකාරියේ ව්‍යුහය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පහත අංශ ක්‍රියාත්මක වේ.

- පරිපාලන හා මානව සම්පත් අංශය
- මූල්‍ය අංශය
- සැලසුම් හා තොරතුරු අංශය
    - සැලසුම් හා නියාමන ඒකකය
    - තොරතුරු හා මාධ්‍ය ඒකකය
      පුස්තකාලය
- වැඩසටහන් අංශය
- මනෝසමාජීය අංශය
- නීති අංශය
    - වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය
- නීතිය බලාත්මක කිරීමේ අංශය
    - 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය
    - විමර්ශන ඒකකය
    - මධ්‍යම ලේඛනාගාරය
- අභ්‍යන්තර විගණන අංශය
- විශේෂ පොලිස් විමර්ශන ඒකකය

## 2018 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය.



## 2018 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලය සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු

| අංකය | තනතුර | වැටුප්- කේත අංකය | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජෙනරාල් | HM -2-1 | 01 | 01 | - |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් | HM -1-3 | 01 | - | 01 |
| 03 | අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත් | HM -1-1 | 01 | 01 | - |
| 04 | අධ්‍යක්ෂ - මූල්‍ය | HM -1-1 | 01 | - | 01 |
| 05 | අධ්‍යක්ෂ - නීති | HM -1-1 | 01 | - | 01 |
| 06 | සායනික මනෝවිද්‍යාඥ | HM -1-1 | 01 | - | 01 |
| 07 | අධ්‍යක්ෂ - සැලසුම් හා තොරතුරු | HM -1-1 | 01 | 01 | - |
| 08 | අධ්‍යක්ෂ - වැඩසටහන් | HM -1-1 | 01 | 01 | - |
| 09 | අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම | HM -1-1 | 01 | - | 01 |
| 10 | සහකාර අධ්‍යක්ෂ - පරිපාලන | MM -1-1 | 01 | 01 | - |
| 11 | සහකාර අධ්‍යක්ෂ - නීති | MM -1-1 | 01 | 01 | - |
| 12 | සහකාර අධ්‍යක්ෂ - වැඩසටහන් | MM -1-1 | 01 | 01 | - |
| 13 | සහකාර අධ්‍යක්ෂ - මනෝවිද්‍යා | MM -1-1 | 01 | 01 | - |
| 14 | සහකාර අධ්‍යක්ෂ - සැලසුම් හා නියාමන | MM -1-1 | 01 | 01 | - |
| 15 | සහකාර අධ්‍යක්ෂ - තොරතුරු හා මාධ්‍ය | MM -1-1 | 01 | - | 01 |
| 16 | සහකාර අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම | MM -1-1 | 01 | 01 | - |
| 17 | ගණකාධිකාරී | MM -1-1 | 01 | 01 | - |
| 18 | අභ්‍යන්තර විගණක | MM -1-1 | 01 | 01 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 19 | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | JM – 1-1 | 01 | - | 01 |
| 20 | පරිපාලන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 21 | වැඩසටහන් නිලධාරි | JM – 1-1 | 01 | - | 01 |
| 22 | ගිණුම් නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 23 | විමර්ශන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 24 | තොරතුරු හා මාධ්‍ය නිලධාරි | JM – 1-1 | 01 | - | 01 |
| 25 | සැලසුම් හා නියාමන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 26 | පර්යේෂණ හා සුභසාධන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 27 | පරිවර්තක (ඉංග්‍රීසි) | MA - 4 | 01 | - | 01 |
| 28 | පරිවර්තක (දමිළ) | MA - 4 | 01 | - | 01 |
| 29 | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 25 | 21 | 04 |
| 30 | දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරි | MA - 3 | 25 | 14 | 11 |
| 31 | ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 360 | 293 | 67 |
| 32 | පරිපාලන සහකාර | MA - 3 | 01 | 01 | - |
| 33 | ගිණුම් සහකාර | MA - 3 | 03 | 02 | 01 |
| 34 | මාධ්‍ය සහකාර | MA - 3 | 03 | 03 | - |
| 35 | පුස්තකාලයාධිපති | MA - 3 | 01 | 01 | - |
| 36 | සැලසුම් සහකාර | MA - 3 | 01 | 01 | - |
| 37 | නීති සහකාර | MA - 3 | 03 | 02 | 01 |
| 38 | විමර්ශන සහකාර | MA - 3 | 02 | 01 | 01 |
| 39 | උපදේශන සහකාර | MA - 3 | 04 | 04 | - |
| 40 | වැඩසටහන් සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 41 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ සහකාර | MA - 3 | 01 | 01 | - |
| 42 | අන්තර්ජාල ආවේක්ෂණ සහකාර | MA - 3 | 01 | - | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 43 | චිකිත්සක | MA - 3 | 03 | 02 | 01 |
| 44 | වීඩියෝ තාක්ෂණ සහකාර | MA – 2-1 | 01 | 01 | - |
| 45 | කළමණාකරන සහකාර (තාක්ෂණික) | MA – 2-1 | 15 | 10 | 05 |
| 46 | තොරතුරු තාක්ෂණ සහකාර | MA – 2-1 | 02 | 02 | - |
| 47 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) | MA – 1-1 | 32 | 28 | 04 |
| 48 | රියදුරු | PL-3 | 07 | 06 | 01 |
| 49 | පණිවිඩකරු | PL-1 | 01 | - | 01 |
| 50 | කාර්යාල කාර්ය සහයක | PL-1 | 03 | 03 | - |
| 51 | කාර්යාල කම්කරු | PL-1 | 02 | 01 | 01 |
| **මුළු සංඛ්‍යාව** | | | **527** | **415** | **112** |

2018 වසරේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සංවර්ධන ක්‍රියාකාරී සැලසුම් 4 ක් යටතේ ක්‍රියාත්මක විය. ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම (රුපියල් මිලියන 60), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ශක්තිමත් කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම (රුපියල් මිලියන 30), 1929 පැය 24 පුරා ක්‍රියාත්මක ළමා දුරකථන සේවයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම (රුපියල් මිලියන 10) සහ ළමුන් සඳහා වන සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම (රුපියල් මිලියන 20) වශයෙන් සඳහන් කළ හැකිය. මේ අනුව රු. මි. 120 ක මුදලක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත මූල්‍ය ප්‍රතිපාදන ලෙස වෙන්ව පැවතිණ.

## ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2018

### ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ ප්‍රධාන කාර්යභාරයක් වේ. ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීමෙන් පසු ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා ලැබුණු මහජන අදහස් කෙටුම්පතට ඇතුළත් කරන ලදී. ඊට අමතරව අධිකාරියේ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් නිලධාරීන්ගේ අදහස් වැඩිදුරටත් ඇතුළත් කිරීමට සාකච්ඡාමය ක්‍රියාමාර්ගයන්හි නිරතව සිටින ලදී.

### පාසල් විෂය මාලාව සඳහා ජීවන නිපුණතා හඳුන්වා දීම

අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එක්ව ප්‍රාථමික අධ්‍යාපනයේ සිටම ජීවන නිපුණතා හඳුන්වා දීම සිදු කරයි. 2017 වසරේ 2 වන ශ්‍රේණිය සහ 3 වන ශ්‍රේණිය සඳහා මෙම ජීවන නිපුණතා හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහනෙහි අරමුණු වන්නේ තම ශරීරය පිළිබඳ නිසි අවබෝධය හා එය ආරක්ෂා කර ගැනීම පිළිබඳ නිසි හැකියාව ඇති කිරීම තුළින් ළමුන්ට අපයෝජනවලින් ආරක්ෂාවීමට අවශ්‍ය පසුබිම ඇති කිරීමයි. එමෙන්ම තීරණ ගැනීම, ප්‍රශ්න විසඳීම, නිර්මාණාත්මක චින්තනය, විචාරාත්මක චින්තනය, අන්තර්පුද්ගල සබඳතා, ස්වයං අවබෝධය, සානුකම්පිත බව, හැඟීම් කළමනාකරණය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ආතති කළමනාකරණය යන විෂයධාරාවන් ඔස්සේ ළමුන් ඉගෙනුම කෙරෙහි යොමු කිරීමත් මෙමගින් සිදුවේ. මේ සඳහා අවශ්‍ය ගුරු පුහුණු පාඨමාලා ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව සකස්කර අවසන් කර තිබේ. ගුරු උපදේශකවරුන් සඳහා පුහුණු ආධාරක වශයෙන් වීඩියෝ පට 03ක් 2017 වර්ෂයේදී සකස් කරන ලදී. 2018 වසර තුළදී ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කළ විෂයමාලා අධ්‍යයනය කිරීම සිදු කර ඇත. පුහුණු ආධාරක වශයෙන් සකස් කළ වීඩියෝ පට 03 අධ්‍යාපන අමාත්‍යාංශයේ

නැණසෙ වෙබ් අඩවියේ පළ කර තිබේ.මේ කාර්ය සම්බන්ධයෙන් පළාත් 09 හි අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් ද දැනුවත් කරන ලදි. 2 සහ 3 ශ්‍රේණි සඳහා ළමා ආරක්ෂාවට අදාළ කරුණු ඇතුළත් අත්පත්‍රිකා 13,000ක් මුද්‍රණය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

## හදිසි ආපදා තත්ත්වයන්හිදී ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පිළිපැදිය යුතු වන මාර්ගෝපදේශ ඇතුළත් අත්පොත සකස් කිරීම (දරුවන් සඳහා මනෝසමාජීය ප්‍රථමාධාර)

ජල ගැලීම්, සුළිසුලං, නායයෑම්, භූමිකම්පා හා සුනාමි අවස්ථා හේතුවෙන් ඕනෑම වේලාවකදී ආපදා තත්ත්වයක් ඇති විය හැකියි. එවැනි ආපදා තත්ත්වයකදී ළමයින් දැඩි අපහසුතාවයන්ට ලක් වේ. එබැවින් ආපදා තත්ත්වයකදී ළමයින් රැකබලා ගැනීම විශේෂ අවධානයකින් සිදු කළ යුතුය. මෙහිදී කඳවුරු තුළදී ළමුන්ගේ මානසික සෞඛ්‍ය නගා සිටුවීම සහ ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කළ යුතුය. මෙවැනි අවස්ථාවලදී ළමයින්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතුයි.එය සැළකිල්ලට ගනිමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අදාළ පාර්ශවකරුවන් සමග එක්ව මාර්ගෝපදේශ ඇතුළත් අත්පොත සකස් කිරීම ආරම්භ කර ඇත. මෙහි අරමුණු වන්නේ ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම, සාමාන්‍ය ක්‍රියාකාරකම් උපයෝගී කර ගනිමින් පවුල හා ළමයා අතර සම්බන්ධතාවය ගොඩනැගීම සහ ප්‍රජාව බලගැන්වීමත්ය. මේ සඳහා ජාතික හා අන්තර්ජාතික වශයෙන් අදාළ තොරතුරු රැස්කර අවසන් කර ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා සම්බන්ධ වී හදිසි ආපදා තත්ත්වයන්හිදී පිළිපැදිය යුතු ළමා ආරක්ෂාව සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීමට අදාළ මූලික කටයුතු සිදු කරමින් පවතී. මෙම කෙටුම්පත සකස් කිරීම සම්බන්ධයෙන් ඉලක්කගත සම්මුඛ සාකච්ඡා ආරම්භ කිරීම සිදු කර ඇත. 2018.09.21 වන දින කෑගල්ල දිස්ත්‍රික්කයේ නිලධාරීන් 15 ගෙන් සමන්විතව මෙම ඉලක්කගත සම්මුඛ සාකච්ඡාව අවසන් කිරීමට හැකිවිය. එහිදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කෑගල්ල දිස්ත්‍රික් නිලධාරීන්, ප්‍රාදේශීය නිලධාරීන් සහ ප්‍රධාන කාර්යාලයේ මනෝසමාජීය නිලධාරින්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්, උපදේශන නිලධාරීන්, සමාජසේවා නිලධාරීන්, ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් මෙම සාකච්ඡාව වෙනුවෙන් සහභාගි විය. මෙම මාර්ගෝපදේශ ඇතුළත් අත්පොතෙහි කෙටුම්පත අවසන් කර ඇත.

## ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම

ළමයාගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමේදී ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ජීවත් වන ළමුන්ගේ රැකවරණය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම සිදු කළ යුතු වේ. ඒ සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා රැකවරණ සේවා සපයන ආයතන සඳහා මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් සංග්‍රහයක් සකස් කිරීම ආරම්භ කර තිබේ. මෙහි මූලික අරමුණ වන්නේ ජාතික මට්ටමෙන් සෑම ළමා නිවාසයකම (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) ගුණාත්මක බව හා ප්‍රමිතිගත ක්‍රියාවලිය සහතික කිරීම සහ ආරක්ෂිත මෙන් ම ළමා හිතකාමී ළමා නිවාස (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) සේවාවක් ප්‍රවර්ධනය කිරීමයි. පළාත් පරිවාස කොමසාරිස්වරුන් සමග සාකච්ඡාවක් ද සිදු කරන ලදී. මෙහි කෙටුම්පත සකස් කර අවසන් කර ඇත. කැබිනට් අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතය.

## සාමාන්‍ය ළමා සුරැකුම් පාඨමාලාවේ පුහුණු කරුවන්ගේ මාර්ගෝපදේශය මුද්‍රණය කිරීම (NVQ Level 4)

2016 වසරේදී රුපියල් මිලියන 50 මුදලක් ළමා රැකවරණ සපයන්නන්ගේ රාජකාරි ප්‍රමිතිගත කිරීම වෙනුවෙන් වෙන් කරන ලදී. ඒ අනුව ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට අදාළ ජාතික මාර්ගෝපදේශයට සමගාමීව ළමා සුරැකුම් සහතිකපත්‍ර පාඨමාලාව (NVQ Level 4) සකස් කර එය හඳුන්වාදීම සිදු කරන ලදි. ඒ අනුව වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) දිස්ත්‍රික් 5 ක් තුළ (කොළඹ, කළුතර, මහනුවර, ගාල්ල සහ කිලිනොච්චි) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) දිස්ත්‍රික් 25ම ආවරණය වන පරිදි මෙම පාඨමාලාව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි.මෙම පාඨමාලාව මොඩියුල් 12කින් සමන්විත වන අතර ඒ සඳහා පුහුණු අත්පොතක් ද සකසා ඇත.

### සහතික කළ පාසල් සහ රැඳවුම් නිවාසවල සිටින ළමුන් සඳහා මනෝසමාජීය මැදිහත්කරණය

මෙම ආයතනවල ළමුන්ට කායික සහ භෞතික වශයෙන් ගත් කළ ආරක්ෂාව, පෝෂණය, වාසස්ථාන අහිමිවීම, ආර්ථික අපහසුතාවන්ට ලක්වීම ආදි ගැටළුවලට මුහුණ දීමට සිදුව ඇති අතර, ඒ තුළින් ඔවුන්ගේ දෛනික ජීවිතයේ ගුනාත්මකභාවය තර්ජනයට ලක්ව ඇත. එමෙන්ම පාසල් අධ්‍යාපනය බිඳවැටීම, සමාජ විරෝධී චර්යාවන් ඇති වීම, මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම, අනාගත අපරාධකරුවන් බවට පත්වීමට ඇති අවදානම වැඩිවීම සහ පෞරුෂය බිඳවැටීම ආදී සමාජමය ගැටළුවලට මුහුණ දීමට ද සිදුවේ. ඒ වගේම විෂාදය, කාංසාව සහ පෞරුෂ අක්‍රමිකතා ඇති වීම, මානසික ආතතිය ඇතිවීම ආදි චර්යාත්මක හා චිත්තවේගමය අසාමාන්‍යතාවයන් ඇති වීම ද දක්නට ලැබේ. මෙම කරුණු මුල් කර ගනිමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝ සමාජීය අංශය විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. 2018 වසරේ මෙවැනි වැඩසටහන් 05 ක් සිදු කර ඇත.

### දෙමව්පියන් සහ ගුරුවරුන් සඳහා වන ධනාත්මක ශික්ෂණය පිළිබඳ අත්පොත සකස් කිරීම

දෙමාපියන් සහ ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සඳහා අත්පොත සකස් කිරීමට සැලසුම් කර ඇත. මේ තුළින්, පවුල සහ පාසල තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප සහ කුසලතා සංවර්ධනය, දෙමව්පියන් සහ ගුරුවරුන් වෙත ලබාදීම අපේක්ෂා කෙරෙයි. දෙමාපියන් සහ ගුරුවරුන් සඳහා වන ධනාත්මක ශික්ෂණය පිළිබඳව අත්පොත සකස් කිරීමට කටයුතු සිදු කර ඇත. මෙහි දළ සැකැස්ම සහ අන්තර්ගතයන් සකස් කර තිබේ. ඒ සඳහා අවශ්‍ය චිත්‍ර නිර්මාණ අවසන් කර තිබේ.

### ළමා හිතකාමී පාසල් පරිසර නිර්මාණය කිරීම

පාසල් ළමා ආරක්ෂක කමිටු ක්‍රියාකාරිත්වය තුළින් ළමා හිතකාමී පාසල් පරිසරයක් නිර්මාණය කිරීම මෙමගින් අපේක්ෂා කරයි. පාසල් ළමුන් සියලූ ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳ දැනුම, අවබෝධය හා කුසලතාවයන් පාසල් ප්‍රජාව තුළ ඇති කිරීම මේ තුළින් බලාපොරොත්තුවේ. ඒ හරහා ක්‍රියාකාරි පාසල් ප්‍රජාවක් නිර්මාණය කිරීමත් මෙම වැඩසටහනේ මූලික අරමුණවේ. දැනටමත් ස්ථාපිත කර ඇති පාසල් ළමා ආරක්ෂක කමිටු සාමාජිකයන්ගේ කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් සහ පසු විපරම් කටයුතු සිදු කර ඇත. 2017 වසරේ සක්‍රියව පවතින පාසල් ළමා ආරක්ෂක කමිටු පිළිබඳව තොරතුරු දත්ත පද්ධතියකට ඇතුළත් කිරීම ආරම්භ කර තිබේ. 2018 වසර තුළදි පාසල් ළමා ආරක්ෂක කමිටු 1,144 ක් පිහිටුවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදී ඇත.

### ජනපවුර ජාතික වැඩසටහන (ප්‍රජා මූල සංවිධාන බලගැන්වීමේ වැඩසටහන)

මෙම වැඩසටහන සිදු කරනු ලබන්නේ ග්‍රාමීය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින්ය. මෙමගින් ළමා ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීම සඳහා බලපෑම් කළ හැකි ස්වේච්ඡා මහජන නියෝජිතයන් කණ්ඩායමක් ඇති කිරීම සිදු කෙරේ. ළමා අපයෝජනය සහ ඊට අදාළව සමාජ ප්‍රශ්න අවම කිරීම සඳහා ගම් මට්ටමින් කටයුතු කිරීම වඩාත්ම ප්‍රායෝගික ම ක්‍රියාවලියක් වන බැවිණි.

මෙහි සමාරම්භක වැඩසටහන 2018.08.28 වන දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 30 ම ආවරණය වන පරිදි ග්‍රාමසේවා වසම් 1,610 ක ජන පවුර සාමාජිකයින් 5,829 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඉතා සාර්ථකව පැවැත්විය. මෙම වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 30 තුළම පෙ.ව 9.30 ට වැඩසටහන ආරම්භ කළ අතර, ප.ව 4.30ට අවසන් කරන ලදි. මෙම සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම එකම ආකාරයේ ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් වැඩසටහනක් පවත්වන ලදි. සෑම ස්ථානයකදීම මෙම වැඩසටහන සම්බන්ධයෙන් ලිඛිත තක්සේරුවක් ලබා ගන්නා ලදි. එයින් 82% ක ප්‍රමාණයක් මෙම වැඩසටහන "ඉතා හොඳ" බව පවසන ලදි. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ජනාධිපති කාර්යාලයේ "දරුවන් සුරකිමු" ව්‍යාපෘතිය මගින් විශාල සහයෝගයක් ලබා දෙන ලදි.

මේ සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ අත්පොතේ (ළමයින්ට අදාළ නීතිය, ළමයින්ගේ ආරක්ෂාව හා ඔබේ වගකීම) පිටපත් 9000 ක් මුද්‍රණය කරන ලදි. මෙම පොත ජනාධිපති කාර්යාලය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ප්‍රකාශනය කරන ලදි. ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබාදෙන ලදි. මේ සම්බන්ධ 1929 ළමා දුරකථන අංකය පිළිබඳව දැනුවත් කිරීමට පරිසර හිතකාමි බෑග් 2500 නිර්මාණය කරන ලදි.

### ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම සඳහා පවත්වනු ලබන මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ ගුරු වෘත්තියට ප්‍රවේශවීමට අපේක්ෂාවෙන් සිටින ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි ඉගෙනුම ලබන ගුරු සිසුන් වෙත ළමා ආරක්ෂාව සම්බන්ධ දැනුම, ආකල්ප හා කුසලතා ලබාදීම තුළින් ළමුන් පිළිබඳ වඩාත් සංවේදී හා සවිඥානික ගුරු පරපුරක් බිහි කිරීමයි. ඒ අනුව 2018 වසර තුළ දර්ගානගර, ශ්‍රී පාද, අඩ්ඩාලච්චේන, නිල්වලා, බිංගිරිය, හාපිටිගම, පුලතිසිපුර හා මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි මෙම වැඩසටහන් සිදු කර ඇති අතර, එමගින් දැනුවත් වූ මුළු ගුරු සිසුන් ප්‍රමාණය 2,686

### සෞඛ්‍ය වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධනය

සෞඛ්‍ය වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධනය උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නිපුණතා සංවර්ධන වැඩසටහන් පවත්වනු ලබයි. සෞඛ්‍ය වෘත්තිකයන් ළමා ආරක්ෂාව සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන්හි දැනුමෙන් හා කුසලතා වලින් සන්නද්ධ කරලීම තුළින් ළමා ආරක්ෂාව සම්බන්ධ වඩාත් සංවේදී වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම, රාජ්‍ය නිලධාරියෙකු ලෙස ළමා අපයෝජනයකදී හෝ එවැනි අවදානම් තත්ත්වයකදී ක්‍රියාත්මක විය යුතු ආකාරය සම්බන්ධයෙන් නිසි දැනුම, කුසලතා හා ආකල්ප ලබාදීම උදෙසා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. 2018 වසර තුළ පශ්චාත් වෛද්‍ය උපාධි අපේක්ෂිත වෛද්‍යවරුන් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වල සේවයේ නියුක්ත රාජ්‍ය සේවකයන් උදෙසා මෙම වැඩසටහන් 55 ක් සිදු කර ඇත. එමගින් දැනුවත්වූ මුළු ප්‍රමාණය 2,118කි.

### ළමා අපයෝජන වලින් ළමයින් ආරක්ෂා කර ගැනීමේ කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන

ළමයින්ට එරෙහිව සිදුවන කායික දණ්ඩනය, ළමා විවාහ, අනිවාර්යය අධ්‍යාපනය හා ළමයින් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීම යන වත්මන් සමාජයේ කතිකාවතක් ගොඩනැගී ඇති මාතෘකා සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මෙමගින් අරමුණුවේ. ඒ අනුව ඌව පළාතෙහි කන්දකැටිය, රිදීමාලියැද්ද, වැල්ලවාය, සියඹලාණ්ඩුව, කතරගම හා හාලිඇල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06 කේන්ද්‍ර කර ගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති ග්‍රාමසේවා වසම් සියල්ල නියෝජනය වන පරිදි ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 06 ක් පවත්වන ලදි. දැනුවත්වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව700 කි.

### ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව "ළමා ශ්‍රමය පිටු දකිමු" නැමති තේමාව යටතේ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයෙහි නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන

2018 වර්ෂයෙහි ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව "ළමා ශ්‍රමය පිටුදකිමු" නමැති තේමාව යටතේ පොලිස් ළමා කාන්තා කාර්යාංශයෙහි නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. එහි පරමාර්ථය වී ඇත්තේ ආර්ථික වශයෙන් සූරාකෑමෙන් සහ අන්තරායකාරී රැකියාවන්වල ළමුන් නොයෙදීමත්, ළමයින්ගේ සෞඛ්‍යට හෝ ශාරීරික, මානසික, අධ්‍යාත්මික, සදාචාරාත්මක හෝ සමාජ සංවර්ධනයට හානි කරවන යම් ක්‍රියාවන්ගෙන් ආරක්ෂා කිරීමය.ඒ අනුව 2018 වසර තුළදී දැනුවත් කිරීමේ වැඩසටහන් 25 ක් සිදු කර ඇත. එමගින් පොලිස් ළමා කාන්තා කාර්යාංශයෙහි නිලධාරීන් 1,937 ක් දැනුවත් කර ඇත.

### ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනයට සමගාමීව වතු ආශ්‍රිතව හා ධීවර ප්‍රජාව ආශ්‍රිතව ජීවත්වන ගැහැණු ළමුන් සවිබල ගැන්වීමේ වැඩසටහන

2018 ඔක්තෝබර් මස 11 වන දිනට යෙදුනු ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනයට සමගාමීව මහනුවර, මාතලේ, නුවරඑළිය, ගාල්ල, මාතර, කෑගල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි වතු ආශ්‍රිතව ජීවත් වන ගැහැණු ළමුන් සවිබල ගැන්වීම උදෙසා වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කර ඇත. ඒ යටතේ වතු ආශ්‍රිතව ජීවත්වන ගැහැණු ළමුන් සඳහා ස්වයං රැකියා පුහුණුව ලබාදීම, ළමා ආරක්ෂාව, ළමා අයිතිවාසිකම් හා ගැහැණු ළමුන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ වැදගත්කම පිළිබඳව වතු ප්‍රජාව හා ළමුන් දැනුවත් කිරීම සිදු කරයි.
ළමුන්ගේ පෞරුෂ සංවර්ධන හා ජීවන කුසලතා ගොඩනගාගැනීමේ වැඩසටහන් හා උපදේශන වැඩමුළු පැවැත්වීම. තවද අවදානම් සහගත පවුල් හා ළමුන් පිළිබඳ තොරතුරු එක් රැස් කිරීම, වතු ආශ්‍රිතව වෙසෙන

පාසල් යන වයසේ පසුවන නමුදු දරිද්‍රතාවය නිසාවෙන් පාසල් ගමන අඩාලවී ඇති ළමුන් පාසල් ගත කිරීම උදෙසා පාසල් උපකරණ සංචිතයක් පවත්වාගෙන යාම, වතු ආශ්‍රිත පාසල් හි පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හා ඒවා ශක්තිමත් කිරීම, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය හා අන්තර් ජාල, කේබල් රූපවාහිණී හා ජංගම දුරකථන පිළිබඳව දැනුවත් කිරීම. එමෙන්ම වතු ආශ්‍රිතව ළමා ආරක්ෂක ක්‍රියාකාරී ජාල නිර්මාණය කිරීම, දරුවන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීම උදෙසා පුස්තකාල ආරම්භ කිරීම යනාදී ක්‍රියාකාරකම් සිදු කර ඇත.

### වෙරළබඩ කලාපය තුළ ළමා ආරක්ෂාව සඳහා වන නියමු වැඩසටහන

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් වෙරළබඩ කලාපය ආශ්‍රිතව ළමුන් සඳහා සුරක්ෂිත ළමා හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන නියමු ව්‍යාපෘතියේ තෙවන අදියර ලෙස 2018 වර්ෂයේදී වැඩසටහන් 14 ක් ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යාපෘතියට සමගාමීව උපදේශනය සහ මනෝසමාජීය සහාය පිළිබඳ වැඩසටහනක් ඉදිරිපත් කිරීමට සැලසුම් කරන ලදී.එහි ප්‍රධාන අරමුණ වන්නේ සුරක්ෂිත ළමා මිතුරු පරිසරයක් ගම තුල ඇති කිරීමයි.මෙ මගින් සිදු කරන දැන්වීම් පුවරුවලට අදාළ පණිවිඩ සකස් කර අවසන් කර ඇත.

### වතු ආශ්‍රිතව ජීවත්වන ළමුන්ගේ රැකවරණය තහවුරු කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ, වතු ආශ්‍රිතව ජීවත්වන පවුල්, ළමා ආරක්ෂිත පවුල් බවට පත් කරමින්, එහි ජීවත් වන ළමුන් සියළු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරමින් සතුටින් ජීවත්වන පිරිසක් බවට පත් කිරීම මෙන්ම ළමා ආරක්ෂක ක්‍රියාවන්හි නිරතවන නිලධාරීන් පිරිසක් වතු ආශ්‍රිතව බිහි කිරීමය. ඒ අනුව 2018 වසර තුළ රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන් සහ වතු ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 32 ක් සිදු කර ඇති අතර, එමගින් දැනුවත් බව ලැබූ ප්‍රමාණය 1,013 කි.

### එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.

ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රජාවේ පවතින්නේ අඩු දැනුම් මට්ටමකි. ළමයාට හිමි අයිතිවාසිකම් පිළිගැනීමට වැඩිහිටියන් තුළ පවතින්නේ ද අඩු නැඹුරුතාවයකි. මෙම කරුණු සැළකිල්ලට ගනිමින් ළමා අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව සම්පූර්ණ පිටුවක විශේෂ ලිපියක් භාෂා මාධ්‍ය 03න්, රජයේ සතිඅන්ත පුවත්පත් වන සිළුමිණ, සන්ඩේ ඔබ්සර්වර් හා තිනකරන්, වාරමංජලී පුවත්පත්හි පළ කිරීම සිදු කරන ලදී.
එමෙන්ම 2018 ලෝක ළමා දිනයට සමගාමීව ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පොදු මහජනතාව හා පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා පෝස්ටර් තරගයක් සංවිධාන කළ අතර, අධ්‍යාපන අමාත්‍යංශයේ ස්වාධීන විනිසුරු මඩුල්ලක් විසින් තරගකරුවන් ඇගයීමට ලක් කරන ලදි. එම තරගාවලිය පාසල් අංශය හා විවෘත අංශය ලෙස අංශ දෙකක් යටතේ පවත්වන ලදි.

**පාසල් අංශය (සමස්ත ලංකා)**




**ප්‍රථම ස්ථානය**
එච්.මොහොමඩ් රිසාද් (සහිරා විද්‍යාලය) අම්පාර




**දෙවන ස්ථානය**
සනුක සන්දීර බස්නායක (ආනන්ද විද්‍යාලය) ගම්පහ



තෙවන ස්ථානය
ඩබ්. ඒ. කවීෂා කවිමිණි (දේවි බාලිකා විද්‍යාලය) කොළඹ

**විවෘත අංශය (සමස්ත ලංකා)**




ප්‍රථම ස්ථානය
ඩබ්. එල්. සුජීව ජයසේන රත්නපුර



දෙවන ස්ථානය
ඩී. ඒ. අයි. වීරසේකර ගම්පහ




තෙවන ස්ථානය
එල්. ඒ. එස්. කරුණාරත්න මහනුවර

## ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රදර්ශන හා ජංගම සේවා පැවැත්වීම හා ළමා ආරක්ෂාව පිළිබඳ නාට්‍ය ඉදිරිපත් කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තොරතුරු හා මාධ්‍ය ඒකකය විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත ප්‍රකාරව ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමයින්ගේ අයිතීන්, ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම සිදු කර ඇත.

ඒ අනුව 2018 වර්ෂයේද අධිකාරිය වෙතින් ඉල්ලුම් කරන ලද අධ්‍යාපනික ප්‍රදර්ශන හා ජංගම ප්‍රදර්ශන කුටි සඳහා ළමා ආරක්ෂාව සම්බන්ධව කුටි ඇතුළත් කිරීම සිදු කරන ලදී. මෙහිදී ළමා ආරක්ෂාව සම්බන්ධව වන විවිධ ප්‍රකාශන බෙදා හැරීම හා තොරතුරු ලබාදීමත් කරනු ලැබේ. එමෙන්ම නිර්මාණශීලීව ළමයින් සහ ප්‍රජාව දැනුවත් කිරීමට අධිකාරියේ ප්‍රදර්ශන සඳහා වීදි නාට්‍ය ශෛලිය යොදා ගැනීම ද සිදු කරන ලදී.
ඒ අනුව 2018 වර්ෂයේදී ජංගම ප්‍රදර්ශන 12ක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් සිදු කර ඇත.










### සුනාමි ව්‍යසනය හේතුකොට ගෙන වින්දිත වූ ළමුන් සඳහා සුබසාධන කටයුතු සිදු කිරීම

සුනාමි විපතෙහි ප්‍රතිඵලයක් වශයෙන් දෙමාපියන් අහිමි වූ වයස අවුරුදු 21ට අඩු සෑම ළමයෙකුම හා යෞවනයෙකු සම්බන්ධ සුබසාධනය පිළිබඳව මෙහිදී සළකා බලයි. දෙමාපිය දෙදෙනාගෙන් එක් අයෙකු අහිමිව හා ජීවත්ව සිටින මවට හෝ පියාට රැක ගැනීමට හා ආරක්ෂාව සැපයීමට හැකියාවක් නොමැති සෑම ළමයෙකුම හා යෞවනයෙකුටම 2005 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත මගින් රැකවරණය සලසයි. වින්දිත වූ ළමුන් උදෙසා කැපකරු මාපිය රැකවරණ කටයුතු, පසුවිපරම් කටයුතු හා සුභසාධන කටයුතු සිදු කෙරේ. සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිතභාවයට පත්වූ ළමුන් 45 දෙනෙකු සඳහා වර්ෂය පුරා අධ්‍යාපන ආධාර ලබා දෙන ලදී.

### ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතයන් බවට පත්වන ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ විශේෂ ඒකකයක් ක්‍රියාත්මක වේ. 1999 අංක 32 දරණ සාක්ෂි (විශේෂ විධි විධාන) පනත ප්‍රකාරව අපයෝජනයට ගොදුරුවී ඇති ළමයෙකුගේ සාක්ෂිය වීඩියෝ පටිගත කර එය අධිකරණය වෙත ඉදිරිපත් කිරීම මෙමගින් සිදු කළ හැකිය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වසරේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 126 ක් සිදු කරන ලදී. ඉල්ලීම් ලද අධිකරණ සඳහා පටිගත කළ සාක්ෂි පිටපත් 71ක් මුදාහැර තිබේ.

### ළමා රැකවරණ සේවා සපයන ළමා නිවාස හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) නියාමනය කිරීමේ වැඩසටහන

ළමුන්ගේ සුරක්ෂිත බව ඇති කිරීම සඳහා පිහිටුවා ඇති ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වර්තමානය වන විට විවිධ ක්‍රියාමාර්ග ඔස්සේ යමින් එම අරමුණ ඉටුකරමින් සිටී. 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ (14.) වගන්තියට අනුව ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන ) අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරා ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා නිවාසයන්හි ජීවත්වන ළමුන්ගේ උපරිම යහපත සලසනු වස් 2018 වර්ෂය සඳහා නියමිත ළමා නිවාස නියාමනය දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදී. මෙහි අරමුණු ලෙස, ළමා රැකවරණ සේවා සපයන පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) නියාමනය කිරීම හා අදාළ විසඳුම් සෙවීමට සම්බන්ධ සියලු ආයතන හා එක්ව ඒකාබද්ධ නියාමන ප්‍රවේශයක් යටතේ වඩාත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස මෙම කාර්යය සිදු කිරීම, ආයතනගත ළමුන්ගේ යහපැවැත්ම හා ආරක්ෂාව තහවුරු වන වඩාත් සුරක්ෂිත ආයතනික පරිසරයක් ඇති කිරීම, හා සේවයේ යෙදෙන පාර්ශවයන්හි දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම යනාදිය වේ. මෙහිදී දිවයින පුරා ළමා නිවාස 322 ක් 2018 වසරේදී නියාමනය කරන ලදී.

### මානසික සෞඛ්‍ය ගොඩනැගීම සඳහා සහය ලබා දීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝ සමාජීය අංශය වෙත සේවය ලබාගැනීම සඳහා පැමිණෙන ළමුන් සඳහා සහ මනෝ සමාජීය සහයන් අපේක්ෂා කරන ළමුන් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, මෙමගින් සිදු කරයි. මෙම වසර තුළ ළමුන් 126 ක් සඳහා සහය ලබාදී ඇත.

### ළමා අපයෝජනය හේතු කොට වින්දිත, ආන්තික හා අනාරක්ෂිත වූ ළමුන් සඳහා ලෝක ළමා දින සැමරුමට සමගාමීව අධ්‍යාපනික පහසුකම් සැපයීම

ළමා අපයෝජනය හේතු කොට වින්දිත, ආන්තික හා අනාරක්ෂිත ළමයින් හඳුනා ගැනීමෙන් ඔවුන් වෙත අධ්‍යාපන පහසුකම් ලබා දීමට කටයුතු සිදු කරයි. සැමට අධ්‍යාපනය යන තිරසර සංවර්ධන තේමාව යටතේ ළමා අපයෝජනය හේතු කොට වින්දිත, අනාරක්ෂිත හා ආන්තික වන ළමයින් වෙත අධ්‍යාපන ආධාර ලබාදේ. අධ්‍යාපන ආඥා පනතේ අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි බල ගැන්වීම ද මෙහි ප්‍රධාන අරමුණක් වේ. ඒ අනුව මෙම වසර තුළ ඒ අනුව මෙම වැඩසටහන යටතේ ළමුන් 1000 කට පමණ අධ්‍යාපනික ආධාර ලබා දෙන ලදී.

### හදිසි ආපදා තත්ත්වයන් සඳහා සූදානම් වීම හා දැනුවත් කිරීම

හදිසි ආපදා අවස්ථාවන්වල දී ළමයින් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට අධිකාරියේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන්ට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය ලබාදීම තුළින් මෙවැනි තත්ත්වයක දී ළමුන් ආරක්ෂා කර ගැනීම මෙහි අරමුණයි. 2018 වසර තුළදී දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ප්‍රධාන කාර්යාල නිලධාරීන්ගෙන් සමන්විත හදිසි ආපදා සේවා කණ්ඩායමක් සකස් කරන ලදි. මෙම වසරේදී වැඩසටහන් 01 සිදු කර ඇත.

### සංවර්ධන වැඩසටහන් නියාමනය හා ඇගයීම


ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ක්‍රියාත්මක සංවර්ධන ක්‍රියාකාරී සැලසුම්වල ප්‍රගතිය නියාමනය හා ඇගයීම සිදු කරයි. එමගින් අධිකාරියේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් වෙත සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති කළමනාකරණය සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය සිදු කිරීම සහ වැඩසටහන් සඳහා පෙර ඇගයුම් හා පසු ඇගයුම් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරයි. පළාත් 09 නිලධාරීන් එවනු ලබන මාසික වාර්තා තුළින් නියාමනය සහ ඇගයීම මාසිකව සිදු කරනු ලැබේ. 2018 වසර තුළ පළාත් 09 යේ දිස්ත්‍රික් 25 ම ආවරණය කරමින් මෙම වැඩසටහන් 09 සිදු කරන ලදී.

### ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ නව තොරතුරු වෙබ් අඩවිය සංවර්ධනය කිරීම.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය **www.childprotection.gov.lk** සහ තොරතුරු වෙබ් අඩවිය **www.youthink.lk** නමින් ළමා ආරක්ෂාව පිළිබඳ තොරතුරු ඇතුළත් වෙබ් අඩවි සංවර්ධනය කිරීම සිදුවේ.

ළමා අපයෝජනවලින් ළමුන් ආරක්ෂා කර ගනිමින් ඔවුන්ට සුරක්ෂිත වටපිටාවක් උරුම කර දීමට අදාළ තොරතුරු එම වෙබ් අඩවියට ළමා හිතකාමී ලෙස ඇතුළත් කර ඇත. එම වෙබ් අඩවි යාවත්කාලීන කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තොරතුරු හා මාධ්‍ය ඒකකය මගින් සිදු කරනු ලබයි. නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතියි.







**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුස්තකාලය සංවර්ධනය කිරීම.**

2016 වර්ෂයේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සඳහා නව පුස්තකාලයාධිපතිනියක් බඳවා ගැනීම සිදු කළ අතර, ළමා ආරක්ෂක විෂය ක්ෂේත්‍රයට අදාළව විමර්ශන පුස්තකාලයක් නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු රාශියක් මෙම කාලසීමාව තුළ සිදු කරන ලදි.

විශේෂයෙන් අධිකාරිය වෙත පැමිණෙන පුද්ගලයන් සඳහා ඉතා පහසුවෙන් තොරතුරු ලබාගැනීමට නව පුස්තකාල පරිශ්‍රයක් සකස් කිරීම සඳහා සැලසුම් කිරීම 2018 වර්ෂයේදී සිදු කරන ලදී. මෙහිදී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය මගින් එම බිම් සැලැස්ම සකස් කළ අතර, ඉදිරි වසරවල දී මෙම පුස්තකාලය පරිශ්‍රය සකස්කිරීමට ද සැලසුම් කර ඇත.

මෙම විමර්ශන පුස්තකාලයේ පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වන්නේ උපරිම ගුණාත්මකභාවයකින් යුතුව තොරතුරු සේවා හා තොරතුරු මූලාශ්‍ර ලබා දෙමින් ළමා ආරක්ෂාව සම්බන්ධ පර්යේෂණ සඳහා සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීමයි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණෙන පර්යේෂකයන්ට, නිලධාරීන්ට සහ අධ්‍යාපන ආයතනවල අනිකුත් පුද්ගලයන්ට ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් තොරතුරු ලබාදීම හා පොත් පරිශීලනය සඳහා අවස්ථාව ලබාදීම මෙන්ම, විද්‍යාර්ථීන්ට සහ පාසල් සිසු දරුදැරියන් වෙත ද තොරතුරු ලබාදීම අධිකාරියේ පුස්තකාලයාධිපතිනිය විසින් සිදු කරනු ලබයි.




ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය
විසින් සකස් කළ නව විමර්ශන පුස්තකාල බිම් සැලැස්ම

**දිවාසුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන ජාතික මාර්ගෝපදේශ සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ අමාත්‍යාංශය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ළමා ලේකම් කාර්යාලය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමග එක්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මූලිකත්වය ගනිමින් කටයුතු කර ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන මාර්ගෝපදේශ සංග්‍රහයේ කෙටුම්පත සකස් කර ඇත. මෙහි අරමුණු ලෙස ජාතික මට්ටමින් සෑම දිවාසුරැකුම් මධ්‍යස්ථානයකම ගුණාත්මක බව හා ප්‍රමිතිගත ක්‍රියාවලිය සහතික කිරීම සහ වෘත්තීයමය සහ ආරක්ෂිත දිවා සුරැකුම් සේවාව ප්‍රවර්ධනය කිරීම හැඳින්විය හැකිය. මේ සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබේ. මෙහි පිටපත් 5,000 ක් මුද්‍රණය කිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබේ.

**අඩු වයස් විවාහ වැළැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මේ සම්බන්ධයෙන් විශේෂ වැඩසටහනක් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට නියමිතවේ. මෙහි අරමුණ වන්නේ තොරතුරු සාක්ෂි මත පදනම්ව තෝරාගන්නා, දිස්ත්‍රික් 25ට අදාළව අඩු වයස් විවාහ අවම වීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්ත විධිමත් වැඩසටහනක් ස්ථාපිත කිරීම හා එහි ප්‍රතිලාභ අදාළ පාර්ශවයන් වෙත ලබාදීමයි. මෙම වර්ෂය තුළ වැඩසටහන් 19 ක් සිදු කරන ලදි.

**ළමා ජාවාරම්කරණයේ පවතින ගැටලු නිර්මාණශීලිව අවබෝධ කර ගැනීම සහ එම වින්දිතයින් නැවත සමාජගත කිරීම පිළිබඳ අත්පොත නිර්මාණය කිරීම**

මෙය කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමග ඒකාබද්ධව සිදු කරන වැඩසටහනකි. ශ්‍රී ලංකාව තුළ සිදු වන ළමා ජාවාරම හඳුනා ගැනීම,

වාර්තා කිරිම හා විමර්ශනයට අදාළ මෙවලම් සැකසීම මෙහි අරමුණවේ. මේ සඳහා කොළඹ විශ්ව විද්‍යාලය හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි. මීට අදාළව විෂය මාලාව සංවර්ධනය කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. අත්පොත හා මෙවලම් සැකසීමට නියමිතව ඇත.

**තොරතුරු ලබාදීම.**

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 14 (ඇ), (ජ) හා (ඩ) වගන්ති ප්‍රකාරව ළමා අපයෝජන අවම කිරීමට අදාළව මහජනතාව වෙත තොරතුරු ලබා දීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් සිදු කරනු ලැබේ.
ඒ අනුව ළමා ආරක්ෂාව, ළමා අපයෝජන සහ ළමා අයිතිවාසිකම් පිළිබඳව මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබා දීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තොරතුරු හා මාධ්‍ය ඒකකය විසින් සිදු කරයි. එහිදී අවශ්‍යතාවය පරිදි පෝස්ටර්, අත්පත්‍රිකා, පොත්, ස්ටිකර් ඇතුලු වෙනත් මුද්‍රිත ප්‍රකාශන සහ ළමා ආරක්ෂාව සම්බන්ධ වාර්තා වැඩසටහන්, වීඩියෝ ඇතුලු වෙනත් විද්‍යුත් ප්‍රකාශන ලබාදීමද සිදු කරයි. මෙම වසර තුළ අධිකාරියේ විවිධ ප්‍රකාශන 76,384ක ප්‍රමාණයක් බෙදා දී ඇත.

**ජනමාධ්‍ය සම්බන්ධීකරණය**

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 14 (ඇ) හා (ජ) වගන්ති ප්‍රකාරව ළමයින්ගේ සුරක්ෂිතතාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීමේ ප්‍රධානතම මාධ්‍ය වන ජනමාධ්‍ය හරහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පණිවුඩ සමාජගත කිරීම සම්බන්ධීකරණය තොරතුරු හා මාධ්‍ය ඒකකය විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව විවිධ තේමා ඔස්සේ 2018 වර්ෂයේදී ප්‍රවෘත්ති නිවේදන 47ක් නිකුත් කර ඇත.

**ළමා අපයෝජන / ළමා සැකකරුවන් පිළිබඳ වාර්තාකරණයේදී ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ජනමාධ්‍යවේදීන් විසින් සැළකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය**

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මගින් ලොව සෑම ළමයෙකුටම හිමිවිය යුතු අයිතිවාසිකම් මෙන්ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහි ලා රාජ්‍ය සතු වගකීමද පුළුල්ව විග්‍රහකර ඇත. ශ්‍රී ලංකාවද 1991 වසරේදී එකී ප්‍රඥප්තියට අනුකූල වෙමින් ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට එකඟතාවය පළ කරන ලදී. මේ අනුව ළමයින් ආරක්ෂාවට අදාළව තොරතුරු සමාජගත කිරීමේ කර්තව්‍යයේදී ජනමාධ්‍යයට සිදු කළ හැක්කේ සුවිශේෂී මෙහෙයකි. නමුත් වර්තමානය වන විට ළමා අපයෝජන, ළමා සැකකරුවන් පිළිබඳ වාර්තාකරණයේදී ජනමාධ්‍යවේදියාගේ භූමිකාව ගැටළු සහගත බවට පත්ව ඇත. මාධ්‍ය ආචාර ධර්මයන්ට අනනුකූලවෙමින් කටයුතු කරන අවස්ථා දැක ගත හැක. විශේෂයෙන් ළමා අපයෝජන වලට අදාළ ප්‍රවෘත්ති වාර්තාකරණයන් මගින් පීඩාවට පත් පාර්ශවයන් නැවත වරක් සමාජය ඉදිරියේ හිංසනයට ලක්වේ. මෙම හේතූන් අවම කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ජාතික විද්වත් මණ්ඩලයක මාර්ගෝපදේශකත්වයෙන්, ජනාධිපති කාර්යාලයේ දරුවන් සුරකිමු වැඩසටහනට සමගාමීව මෙම ජාතික මාර්ගෝපදේශ සංග්‍රහයේ අවසන් කෙටුම්පත 2018 වර්ෂයේදී සකසා ඇත.

**2018 ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දින ජාතික උත්සවය**

ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය ඔක්තොම්බර් මස 11 වෙනිදාට යෙදී තිබෙන අතර, එකී දිනය සැමරීම සඳහා ජාතික වැඩසටහනක් 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 14 (ඩ) වගන්තිය ප්‍රකාරව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා Plan International Sri Lanka ආයතනය එක්ව සංවිධානය කරන ලදි. 2018.10.11 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ශාලාවේ ලෝටස් ශාලාවේදී මෙම ජාතික උත්සවය පවත්වන ලදී.
එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශයන්ට අනුව, 2018 වසරේදී ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් විශේෂ දක්ෂතා දැක්වූ පාසල් සිසුවියන් 05දෙනෙකු ඇගයීමට ලක්කොට "දිරිය දියණියෝ 2018" සම්මාන සහ සහතික පත්‍ර ප්‍රදානය ද සිදු කරන ලදී. මෙහිදී ක්‍රීඩා අංශය, නව නිපැයුම්, නව සොයාගැනීම, සෞන්දර්යය හා විශේෂ අවශ්‍යතා ඇති දරුවන් යන විෂය බාහිර ක්ෂේත්‍රයන්ගෙන් හි වයස අවුරුදු 18ට අඩු දැරියන් පස්

දෙනෙකු සඳහා මෙම ඇගයීමට ලක්කිරීම සිදු කර ඇත.

දේශපාලන විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය කමලා ලියනගේ මැතිනිය විසින් ගැහැණු ළමයාගේ දිනයට සමගාමීව විශේෂ දේශනයක් පැවැත්වූ අතර, මෙම ජාතික වැඩසටහන සඳහා තෝරාගන්නා ලද පාසල් නියෝජනය කරමින් පාසලේ 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් 75 දෙනෙකු සහභාගී වන ලදී.













**ළමා ආරක්ෂාව පිළිබඳව තොරතුරු ඇතුළත් කර නිර්මාණය කරන ලද, දිවයිනේ පළමු බස් නැවතුම්පල ජනතා අයිතියට පත් කිරීම.**

ළමා ආරක්ෂාව පිළිබඳව තොරතුරු ඇතුළත් කර නිර්මාණය කරන ලද දිවයිනේ පළමු බස් නැවතුම්පළ ජනතා අයිතියට පත් මෙම වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කළ තවත් සුවිශේෂී කාර්යයකි.
මෙම බස්නැවතුම්පළ, මාදිවෙල පිහිටි ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට ඉදිකොට ඇති අතර, ළමා අයිතිවාසිකම් පිළිබඳව, ළමා විවාහ වලක්වා ගැනීම පිළිබඳව හා 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පිළිබඳව තොරතුරු රැසක් මෙම බස් නැවතුම්පළේ කලා ආකෘතිය සඳහා ඇතුළත් කර තිබේ. ළමා හිංසනයන් පිටු දැකීම සඳහා ප්‍රජාව විසින් සිදු කළයුතු කාර්යභාරය පිළිබඳව ද මෙහි තොරතුරු අන්තර්ගතය. අපයෝජනයන්ගෙන් ළමයින් ආරක්ෂා කර ගැනීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම හා මේ විෂය පිළිබඳව සමාජ කතිකාවක් නිර්මාණය කිරීම මෙම නව ව්‍යාපෘතියේ අරමුණ විය.
මෙම බස් නැවතුම්පළ සඳහා යොදා ගන්නා ලද්දේ, 2017 වසරේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් සංවිධානය කළ සමස්ත ලංකා පෝස්ටර් තරගයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය දිනාගත් චිත්‍රය වන අතර, එය ඉදිරිපත් කර තිබුනේ, ජාඇල ක්‍රිස්තුරාජ විද්‍යාලයේ 10වන ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ ඩී. එම්. නිර්මිත තිසුම් දිසානායක ශිෂ්‍යයා විසිනි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ඉදි කරන ලද මෙම බස් නැවතුම්පල සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය **Save the Children** ආයතනය මගින් ලබා දෙන ලදි.සමාජ ආරක්ෂක ක්‍රියාකාරී සැලැසුමට අනුව.



**1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව**

ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත ප්‍රකාරව "ළමා අපයෝජනය පිළිබඳ මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ පැමිණිලි නිසි බලධාරින් වෙත යොමු කිරීම" යන්න වඩාත් ඵලදායී සහ කාර්යක්ෂමව කිරීම සඳහා 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය 2010 ජූලි 22 වන දින ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදී. මෙය ළමා අපයෝජන පැමිණිලි භාර ගැනීම හා ඒවාට කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමුඛතම යාන්ත්‍රණයද වේ. එමගින් සමාජය තුළ සැඟව තිබූ ළමා අපයෝජන සිදුවීම් වාර්තාවීමේ වර්ධනයක්ද දක්නට ලැබේ.
ගාස්තු අයකිරීමකින් තොරව පැය 24 පුරා ක්‍රියාත්මක වන මෙම සේවාව ඇමතීම මගින්, ඕනෑම පුද්ගලයෙකුට ළමයින් සම්බන්ධයෙන් පැන නගින ගැටළු මෙන්ම ළමා අපයෝජන සම්බන්ධයෙන් ද පැමිණිලි කිරීමට හැකියාව පවතියි. මෙමගින් උපදේශන සේවය ලබා ගැනීමට ද අවස්ථාව ලැබේ. මෙම සේවාව මූලිකව ළමුන් සඳහා වෙන්ව ඇතත් ගුරුවරුන්, දෙමව්පියන් සහ ළමා රැකවරණ සපයන්නන් ආදී වැඩිහිටියන්ටද, ළමුන් පිළිබඳ ඔවුන්ට ඇති ගැටළුළමුන් හදාවඩා ගැනීමේ පරිචයන් ආදිය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහාත් භාවිතා කළ හැකිය. 2018 වසර තුළ මෙම දුරකථන අංකයට ඇමතුම් 140,903 ක් ලැබී ඇත. මෙම දුරකථන ඇමතුම් වලින් 8,690 පැමිණිලි වශයෙන් ලැබී ඇත.

## ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබෙන ආකාර කිහිපයකි. එම ක්‍රම පහත සඳහන් කර ඇත.

01. 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය හරහා ලැබෙන පැමිණිලි.
02. අධිකාරියට පැමිණ වාචිකව ඉදිරිපත් කරන පැමිණිලි.
03. ලිපි මගින් ලැබෙන පැමිණිලි.
04. E-mail හෝ සයිබර් ආවේක්ෂණය මගින් ලැබෙන තොරතුරු.මෙම ලැබෙන පැමිණිලි සියල්ල කඩිනමින් විභාගයට ගැනෙන අතර, පැමිණිල්ලේ ස්වභාවය අනුව වර්ග කිරීමකට ලක් වේ. මෙම වසර තුළ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබී ඇති සමස්ත පැමිණිලි ප්‍රමාණය 9,512කි. ඒ අනුව 2018 වර්ෂය සඳහා ලැබී ඇති පැමිණිලි අපයෝජන ස්වාභාවයන් අනුව සහ දිස්ත්‍රික්ක අනුව පහත සඳහන් කර ඇත.

**2018 වසර තුළදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව (දිස්ත්‍රික්ක අනුව)**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොළඹ | 1330 |
| 02 | කළුතර | 540 |
| 03 | ගම්පහ | 1066 |
| 04 | මහනුවර | 420 |
| 05 | මාතලේ | 210 |
| 06 | නුවරඑළිය | 168 |
| 07 | ගාල්ල | 617 |
| 08 | මාතර | 346 |
| 09 | හම්බන්තොට | 361 |
| 10 | යාපනය | 207 |
| 11 | මන්නාරම | 69 |
| 12 | වව්නියාව | 131 |
| 13 | මුලතිව් | 98 |
| 14 | කිලිනොච්චි | 104 |
| 15 | මඩකලපුව | 189 |
| 16 | අම්පාර | 229 |
| 17 | ත්‍රිකුණාමලය | 137 |
| 18 | කුරුණෑගල | 823 |
| 19 | පුත්තලම | 440 |
| 20 | අනුරාධපුරය | 434 |
| 21 | පොළොන්නරුව | 246 |

| | | |
|---|---|---|
| 22 | බදුල්ල | 237 |
| 23 | මොණරාගල | 224 |
| 24 | රත්නපුර | 537 |
| 25 | කෑගල්ල | 349 |
| | ***මුළු සංඛ්‍යාව*** | **9,512** |

**2018 වසර තුළදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබුණු පැමිණිලි ස්වාභාවය අනුව වර්ගීකරණය**

| | පැමිණිලි ස්වාභාවය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීත්‍යානුකූල නොවන අයුරින් රඳවා තබා ගැනීම තහනම් කිරීම | 02 |
| 02 | ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය ප්‍රකාශන සහ ප්‍රදර්ශන | 15 |
| 03 | ළමයින්ට සිඟාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම | 315 |
| 04 | සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම | 40 |
| 05 | වයස අවුරුදු 12 ට අඩු දරුවකු, මව්පියන් හෝ දරුවා භාරව සිටින තැනැත්තකු විසින් බැහැරලීම හා අත්හැර දැමීම | 03 |
| 06 | ළමයින් කෲරත්වයට ලක්කිරීම | 2,413 |
| 07 | ලිංගික අතවර කිරීම | 555 |
| 08 | නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම | 120 |
| 09 | පැහැරගෙනයාම | 45 |
| 10 | ළමා ලිංගික සුරාකෑම | 04 |
| 11 | තැනැත්තන් වෙළඳාම් කිරීම | 125 |
| 12 | ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම | 15 |
| 13 | ස්ත්‍රී දූෂණය | 311 |
| 14 | ව්‍යභිචාරය | 01 |
| 15 | අස්වාභාවික වැරදි | 01 |
| 16 | තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | 07 |
| 17 | බරපතල ලිංගික අපයෝජනය | 375 |
| 18 | නොසළකාහැරීම | 536 |
| 19 | ළමා මෙහෙකාර සේවය | 262 |
| 20 | අනිවාර්යය අධ්‍යාපනය | 1267 |

| | | |
|---|---|---|
| 21 | ගෘහස්ත ප්‍රචණ්ඩත්වය | 104 |
| 22 | ළමා අපචාර | 374 |
| 23 | වෙනත් | 2,622 |
| | ***මුළු සංඛ්‍යාව*** | **9,512** |

## නීතිමය කර්තව්‍යයන්

අපයෝජනයට ගොදුරුවූ ළමුන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම, ළමා අපයෝජන පිටුදැකීම සඳහාවූ නීතිමය හෝ පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම, නීති උපදෙස් ලබාදීම සහ ළමා අපයෝජන සම්බන්ධ සියලූ විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම හා ඊට අදාළව අධිකරණයෙහි පෙනීසිටීම යනාදී කාර්යයන් නීති අංශය මගින් ඉටු කරනු ලබයි. අධිකාරි පනතට අමතරව පහත පනත්වලට අදාළවද කටයුතු කරයි.

- 2005 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත
- 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ක්‍රියාත්මක නීති අංශය මගින් 2018 වර්ෂයේ දී නීති උපදෙස් ලබාදීම් යටතේ දුරකථන මාර්ගයෙන් 536ක් සහ සේවාලාභීන් 200 දෙනෙක් අධිකාරියට පැමිණ නීති උපදෙස් ලබාගන්නා ලදී. එමෙන්ම අධිකරණයේ නඩු සඳහා පෙනීසිටීම් 20 ක් සඳහා සහභාගි වී ඇත. රැස්වීම් 59 කට සහභාගි වී ඇත.

**2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත අනුව නීති අංශය දායකවූ නඩු සංඛ්‍යාව**

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| බත්තරමුල්ල ළමා අධිකරණය | 04 |
| ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 05 |
| මාතර මහේස්ත්‍රාත් අධිකරණය | 10 |
| හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණය | 19 |
| තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| වලස්මුල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 11 |
| කළුතර මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| ***මුළු සංඛ්‍යාව*** | **53** |

**නීති අංශය අධිකරණයන් ඉදිරියේ සිදු කළ පෙනීසිටීම් සංඛ්‍යාව**

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් අධිකරණය | 03 |
| ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණය | 03 |
| හිගුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| කුළියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| ශ්‍රේෂ්ඨාධිකරණය | 03 |
| බත්තරමුල්ල ළමා අධිකරණය | 06 |
| ***මුළු සංඛ්‍යාව*** | **20** |

**නීති අංශය ස්වාධීන කොමිෂන් සහ වෙනත් විමර්ශන ආයතන ඉදිරියේ සිදු කළ පෙනී සිටීම් සංඛ්‍යාව**

| ආයතනය | පෙනී සිටීම් සංඛ්‍යාව |
|---|---|
| කම්කරු දෙපාර්තමේන්තුව | 01 |
| මානව හිමිකම් කොමිසන් සභාව | 03 |
| **මුළු සංඛ්‍යාව** | **04** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත යොමුවන පැමිණිලි සඳහා නීති අංශයේ දායකත්වය

1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව වෙත යොමු වන පැමිණිලි, තැපැල් මාර්ගයෙන් හා අධිකාරිය වෙත පැමිණෙන සේවාලාභීන් මාර්ගයෙන් යොමු වන පැමිණිලි යනාදී වශයෙන් දෛනිකව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ළමයින් සම්බන්ධ පැමිණිලි වාර්තාවීම් සිදුවේ. එසේ වාර්තා වන පැමිණිලි අධිකාරියේ නීති බලාත්මක කිරීමේ අංශය විසින් අධිකාරියේ ක්‍රියාත්මක සෙසු අංශ වෙත එනම් නීති අංශය, විමර්ශන ඒකකය, මනෝසමාජීය අංශය සහ විශේෂ පොලිස් විමර්ශන ඒකකය යන අංශයන් වෙත පැමිණිල්ලේ ස්වභාවය මත යොමු කරනු ලැබේ.

ඒ අනුව ළමා ශ්‍රමය, අනිවාර්ය අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටළු සහ භාරය හා ආරක්ෂාව සම්බන්ධ පැමිණිලි නීති අංශය වෙත යොමුවේ. 2018 වර්ෂයේදී නීති අංශය වෙත පැමිණිලි 1,670 ක් යොමු වී ඇති අතර, එය දිස්ත්‍රික් මට්ටමින් පහත පරිදිවේ.

| දිස්ත්‍රික්කය | 2018 වසරේ නීති අංශය වෙත ලැබී ඇති පැමිණිලි |
|---|---|
| අම්පාර | 48 |
| අනුරාධපුරය | 71 |
| බදුල්ල | 55 |

| | |
|---|---|
| මඩකලපුව | 47 |
| කොළඹ | 170 |
| ගාල්ල | 126 |
| ගම්පහ | 178 |
| හම්බන්තොට | 52 |
| යාපනය | 49 |
| කළුතර | 92 |
| මහනුවර | 62 |
| කෑගල්ල | 56 |
| කිලිනොච්චිය | 13 |
| කුරුණෑගල | 149 |
| මන්නාරම | 15 |
| මාතලේ | 45 |
| මාතර | 61 |
| මොනරාගල | 35 |
| මුලතිවු | 19 |
| නුවරඑළිය | 34 |
| පොළොන්නරුව | 43 |
| පුත්තලම | 89 |
| රත්නපුර | 100 |
| ත්‍රිකුණාමලය | 34 |
| වව්නියාව | 27 |
| **මුළු සංඛ්‍යාව** | **1,670** |

උක්ත පැමිණිලි අතුරින් ළමා ශ්‍රමය සම්බන්ධව වාර්තා වන පැමිණිලි සුදුසු පියවර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශය වෙත යොමු කර ඇති අතර, සෙසු පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් වෙත සුදුසු පියවර ගැනීම සඳහා යොමු කර ඇත. ඒ අනුව 2018.01.01 සිට 2018.12.31 දින දක්වා නීති අංශයට යොමු වූ සමස්ත පැමිණිලි වලින් පැමිණිලි 545 ක් සඳහා අවශ්‍ය නීති පියවර ගෙන පැමිණිලි අවසන් කිරීමට නීති අංශය සමත්ව ඇත.

## විශේෂ පොලිස් විමර්ශන

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ඔස්සේ හා වෙනත් ක්‍රම මගින් මහජනතාවගෙන් ලැබෙන ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි කඩිනමින් විමර්ශනය කර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය කටයුතු කරමින් සිටියි. ඒ සඳහා 24 පැය පුරාවටම ක්‍රියාත්මක වන නිලධාරීන් 34ක ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් යොදවා ඇත.

## 2018 වර්ෂයේ දී විශේෂ පොලිස් විමර්ශන ඒකකයට සෘජුව ලැබුණු පැමිණිලි

| පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි ගණන | විමර්ශනයේ වර්තමාන තත්ත්වය (මූලික පොලිස් විමර්ශන) | පොලිස් ස්ථානය මගින් විභාග කර සමථයට පත් කළ පැමිණිලි | අධිකරණයේ විභාග වන ගණන | අධිකරණයේ විභාග අවසන් ගණන |
|---|---|---|---|---|---|
| සුළු අපරාධ | 52 | විමර්ශන අවසන් | - | 36 | 16 |
| විවිධ පැමිණිලි | 56 | විමර්ශන අවසන් | 47 | 09 | - |
| බල අපරාධ | 36 | විමර්ශන අවසන් | - | 34 | 02 |
| **මුළු සංඛ්‍යාව** | **144** | - | **47** | **79** | **18** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සඳහා 2018 වර්ෂය තුළ පැවැත්වූ පුහුණු වැඩමුළු

| පුහුණු වැඩසටහනේ නම | දිනය | ස්ථානය | සහභාගි වූ නිලධාරින් සංඛ්‍යාව | පුහුණු කාලය |
|---|---|---|---|---|
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලසුම පිළිබඳව දැනුවත් කිරීම සහ සේවක අභිප්‍රේරණ වැඩසටහන | 2018.05.30 සහ 2018.05.31 | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ශ්‍රවනාගාරය | 120 | පැය 16 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ක්‍රියාකාරී සැලසුම පිළිබඳ දැනුවත් කිරීම සහ සේවක අභිප්‍රේරණ වැඩසටහන | 2018.06.21 | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ශ්‍රවනාගාරය | 120 | පැය 08 |
| අභ්‍යන්තර විගණනය සහතික පත්‍ර පාඨමාලාව | 2018.07.24, 2018.07.26, 2018.07.31 සහ 2018.08.07,2018.08.14,2018.08.21,2018.08.28 | නිපුණතා සංවර්ධන අරමුදල | 01 | පැය 48 |
| ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි | 2018.08.30 සහ 2018.08.31 | නිපුණතා සංවර්ධන අරමුදල | 03 | පැය 16 |

| | | | | |
|---|---|---|---|---|
| කාර්යාභිවර්ධන පුහුණුව | 2018.09.03 සහ 2018.09.04 | නිපුණතා සංවර්ධන අරමුදල | 06 | පැය 16 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නවක ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් සඳහා නේවාසික පුහුණු වැඩසටහන | 2018.12.26 සිට 2018.12.30 දක්වා | ගොවිජන සේවා මධ්‍යස්ථානය - පොතුහැර | 66 | පැය 40 |
| **පුහුණුව ලැබූ සමස්ත නිලධාරීන් සංඛ්‍යාව** | | | **316** | |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

(රුපියල්)

| විස්තරය | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| *ආදායම* | | | |
| පුනරාවර්තන ප්‍රදාන මහාභාණ්ඩාගාරය | | 236,480,000.00 | 230,972,593.19 |
| අනෙකුත් ආයතන | 1 A | 68,494.88 | 1,197,600.01 |
| අනෙකුත් ආදායම් | 1 B | 23,503,171.77 | 23,966,627.04 |
| ජාතික ක්‍රියාකාරි සැලැස්ම සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | | 45,078,475.70 | 39,362,693.04 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා ප්‍රදාන | 1 C | 1,000.00 | 448,800.00 |
| මුළු ආදායම | | **305,131,142.35** | **295,948,313.28** |
| *වියදම්* | | | |
| පරිපාලන වියදම් | 2 | 218,712,109.88 | 214,624,146.43 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 3 | 93,776,458.60 | 98,018,188.89 |
| ව්‍යාපෘති වියදම් | 4 | 68,494.88 | 1,197,600.01 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම් | 5 | - | 594,300.00 |
| මූල්‍ය වියදම් | 6 | 12,967.08 | 12,750.72 |
| මුළු වියදම් | | **312,570,030.44** | **314,446,986.05** |
| කාලච්ඡේදයට අදාල ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) | 7 | **(7,438,888.09)** | **(18,498,672.77)** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2018.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(රුපියල්)

| විස්තරය | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| වත්කම් | | | |
| *ජංගම නොවන වත්කම්* | | | |
| දේපල පිරියත හා උපකරණ | 8 | 86,302,081.19 | 103,384,535.03 |
| නොනිමි වැඩ වව්නියා ගොඩනැගිල්ල සැකසීම | | 3,026,148.14 | - |
| කල්බදු ඉඩම් | | 21,707,906.51 | 22,486,947.61 |
| ආයෝජන හා ඉතිරිකිරීම් | 9 | 7,982,626.65 | 8,040,348.65 |
| දිගුකාලීන ලැබිය යුතු වත්කම් | 10 | 501,043.36 | 1,020,779.99 |
| | | **119,519,805.85** | **134,932,611.28** |
| *ජංගම වත්කම්* | | | |
| තොගය ලිපි ද්‍රව්‍ය | | 487,502.77 | 459,919.81 |
| ආපදා ණය නැවත ගෙවීම් | | 470,734.14 | 470,734.14 |
| ලැබිය යුතු ගිණුම් | 11 | 21,053,750.23 | 24,135,268.31 |
| ඉදිරියට කළ ගෙවීම් | 12 | 666,726.54 | 607,562.00 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 13 | 3,387,629.91 | 4,256,729.99 |
| | | **26,066,343.59** | **29,930,214.25** |
| *මුළු වත්කම්* | | **145,586,149.44** | **164,862,825.53** |
| වගකීම් | | | |
| ජංගම නොවන වගකීම් | | | |
| පාරිතෝෂික වෙන්කිරීම | | 35,394,403.00 | 11,850,245.00 |
| ව්‍යාපෘති ගිණුම්වල අතිරික්තය හෝ /(ඌනතාවය) | 14-A | 1,601,668.55 | 1,592,113.43 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 14-B | (321,549.73) | (322,549.73) |
| | | **36,674,521.82** | **13,119,808.70** |
| *ජංගම වගකීම්* | | | |
| උපචිත වියදම් | 15 | 18,672,035.08 | 11,244,109.98 |
| කෙටිකාලීන වෙන්කිරීම් | 16 | 1,782,034.14 | 1,041,850.14 |
| | | **20,454,069.22** | **12,285,960.12** |
| මුළු වගකීම් | | **57,128,591.04** | **25,405,768.82** |
| *ශුද්ධ වත්කම්* | | **88,457,558.40** | **139,457,056.71** |
| *මූල්‍යනය වන්නේ* | | | |
| ප්‍රාග්ධන ප්‍රදානයන් | 17 | 61,247,752.69 | 64,646,736.53 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 1,930,000.00 | 2,895,000.00 |
| රඳවාගත් ඉපැයුම් | | 25,279,805.71 | 71,915,320.19 |
| | | **88,457,558.40** | **139,457,056.72** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(රුපියල්)

| විස්තර | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ අතිරික්තය / (ඌනතාවය) | | (7,438,888.09) | (18,498,672.77) |
| **පෙර වසරේ ගැලපුම්** | | | |
| **පාරිතෝෂික වෙන්කිරීම්** | | 17,779,419.00 | - |
| **ප්‍රාග්ධන ප්‍රදානයන් - කල් බදු** | | 17,096,573.27 | - |
| **රඳවාගත් ඉපයීම්** | | (39,195,626.39) | - |
| මුදල් නොවන සංචලනයන් | | | |
| ක්ෂයවීම් | 8 | 21,432,928.78 | 22,753,655.63 |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය | | 779,041.10 | 779,041.10 |
| ක්‍රමක්ෂය වූ ප්‍රාග්ධන ප්‍රදාන | | (21,246,969.88) | (98,103,450.04) |
| ක්‍රමක්ෂය වූ ව්‍යාපෘති අරමුදල් | | 9,555.12 | (4,332,453.39) |
| ක්‍රමක්ෂය වූ ප්‍රාග්ධන සංචිතය | | | (2,153,119.00) |
| ක්‍රමක්ෂය වූ ප්‍රත්‍යාගණන සංචිත | | (965,000.00) | (10,105,000.00) |
| ප්‍රාග්ධන ප්‍රදාන උපකරණ | | - | 1,143,652.18 |
| රඳවාගත් ඉපැයීම් වල වැඩිවීම්/(අඩුවීම්) | | - | 93,370,600.63 |
| ගෙවියයුතු ගිණුම්වල (වැඩිවීම්/අඩුවීම්) | | 7,427,925.10 | (27,782,338.59) |
| කෙටිකාලීන වෙන්කිරීම් (වැඩිවීම්/අඩුවීම්) | | 740,184.00 | 97,000.00 |
| තොග වැඩිවීම (වැඩිවීම්/අඩුවීම්) | | (27,582.96) | (20,604.72) |
| ලැබිය යුතු ගිණුම් වල (වැඩිවීම්/අඩුවීම්) | | 3,081,518.08 | 20,204,055.65 |
| ඉදිරියට කළ ගෙවීම් (වැඩිවීම්/අඩුවීම්) | | (59,164.54) | 1,980,751.31 |
| පාරිතෝෂික දායකය | | 6,137,143.00 | 4,522,658.50 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **5,551,055.59** | **(16,144,223.51)** |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | | (4,358,002.89) | (22,274,875.02) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම | | 7,527.96 | - |
| | | | |

| | | | |
|---|---|---|---|
| නොනිමි වැඩ වට්නියා ගොඩනැගිල්ල සැකසීම | | (3,026,148.14 | - |
| දිගුකාලීන ලැබිය යුතු ගිණුම් වල (වැඩිවීම්/අඩුවීම්) | | 519,736.63 | (920,553.29) |
| ආයෝජන ප්‍රතිලාභ | | 57,722.00 | 1,694,417.55 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(6,799,164.44)** | **(21,501,010.76)** |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන් | | | |
| පාරිතෝෂික ගෙවීම | | (372,404.00) | (178,687.50) |
| සීමිත අරමුදල් වල වැඩිවීම් / (අඩුවීම්) | | - | (465,404.00) |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | | 751,412.77 | 500,000.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **379,008.77** | **(144,091.50)** |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම් | | (869,100.08) | (37,789,325.77) |
| ආරම්භක මුදල් හා මුදල්වලට සමාන දෑ | | **4,256,729.99** | **42,046,055.76** |
| **මුදල් සහ මුදල්වලට සමාන දෑ** | 13 | **3,387,629.91** | **4,256,729.99** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

(රුපියල්)

| | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|
| 2017 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය | **84,882,283.88** | **3,860,000.00** | **90,268,492.96** | **179,010,776.84** |
| **විස්තීර්ණ ආදායම** වර්ෂය සඳහා ලාභය | - | - | (18,353,172.77) | (18,353,172.77) |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (20,235,547.35) | (965,000.00) | | (21,200,547.35) |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | **64,646,736.53** | **2,895,000.00** | **71,915,320.19** | **139,457,056.72** |
| පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම | 17,096,573.27 | **-** | (39,195,626.39) | (22,099,053.12) |
| 2018 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය | **81,743,309.80** | **2,895,000.00** | **32,719,693.80** | **117,358,003.60** |
| **විස්තීර්ණ ආදායම** වර්ෂය සඳහා ලාභය | - | **-** | (7,439,888.09 | (7,439,888.09 |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (20,495,557.11 | (965,000.00) | - | (21,460,557.11) |
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | **61,247,752.69** | **1,930,000.00** | **25,279,805.71** | **88,457,558.40** |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විටිවයි/සී/එන්සීපීඒ/2018/01/22   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2019 මැයි 27 දින

සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.auditorgeneral.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත්, ගිණුම් තැබීමේ දෝෂ හේතුවෙන් දිගුකාලයක සිට පැවති ව්‍යාපෘති අරමුදල් හතරක එකතුව රු. 1,657,000 ක් වූ හර ශේෂ සහ අරමුදල් හයක එකතුව රු. 3,258,669 ක් වූ බැර ශේෂ නිරවුල් කිරීමකින් තොරව එකිනෙකට හිලව්කර රු. 1,601,669 ක් වූ ශුද්ධ බැර ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 වන ඡේදය අනුව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 19,041,533 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 වන ඡේදය අනුව වත්කම් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුවය. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගන්නා ලද රු.4,358,002 ක් වටිනා වත්කම් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.701,926 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 55 වන ඡේදයට පටහැනිව මෝටර් රථ 2 ක් ප්‍රත්‍යාගණනය කිරීමෙන් වූ ප්‍රත්‍යාගණන අතිරික්තය 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම රු.965,000 බැගින් වාර්ෂිකව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ විලම්භිත ආදායම් ලෙස ගලපා තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වා ගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.2 ඡේදයෙහි ඇතුළත් (අ) නිර්දේශය හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව,

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ට) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍ය, කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|
| 1998 අංක 58 දරන ජාතික ළමා ආරක්ෂක පනතේ 14(අ) වගන්තිය ප්‍රකාරව ළමා අපචාර සහ එවැනි අපචාරවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහිලා ආණ්ඩුවට උපදෙස් දීම. | අධිකාරිය පිහිටුවා වර්ෂ 20 ක් ගත වී ඇතත්, ප්‍රතිපත්තිය සකස් කර නොතිබීම හේතුවෙන් විවිධ ආකාරයේ අපචාර, අපයෝජනයන් හා විවිධ හිංසනයන්ට ළමුන් ගොදුරු වීම වැඩි වී තිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තිය සඳහා අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා නොමැති බව.

2016 වර්ෂයේ රු. 18,317,757 ක වටිනාකමකට කල්බදු පදනම යටතේ ලබා ගත් ඉඩම 2019 මැයි 08 වන දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති